අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/18/01/01 (VII වෙළුම) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2022.10.12

චක්‍රලේඛ අංක: 21/2020 (I)

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීම</u>**

අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් සහ මාගේ චක්‍රලේඛ අංක 21/2020 හී සඳහන් විධිවිධානයන් අනුව 2020.07.01 දින සිට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කර ඇති හා ඒ අනුව අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම නිලධාරීන් අංක 2300/09 හා 2022.10.04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව පහත සඳහන් පරිදි ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

02. මෙම සංශෝධිත විධිවිධාන 2020.07.01 දිනට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වී ඇති හා අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කර අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති 2022.01.02 දිනට සේවයේ නියුතු සියලුම ගුරු උපදේශකවරු සඳහා අදාළ වේ.

I. **අන්තර්ග්‍රහණ ලිපි ලද ගුරු උපදේශකවරු**

(අ) දැනට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කර ඇති 2022.01.02 දිනට සේවයේ නියුතු ගුරු උපදේශකවරු සියලුදෙනාගේ අන්තර්ග්‍රහණ ලිපි අවලංගු කිරීමට කටයුතු කරනු ලබන අතර එම නිලධාරීන් 2022.01.02 දින සිට බලාත්මක වන පරිදි ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ඒ අනුව පූර්ව අන්තර්ග්‍රහණ ලිපි අවලංගු කර නව අන්තර්ග්‍රහණ ලිපි ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

II. **අන්තර්ග්‍රහණ ලිපි නොලද ගුරු උපදේශකවරු**

(අ) ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කර මේ වන තෙක් ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපි නොලද ගුරු උපදේශකවරු වේ නම් එම නිලධාරීන් 2022.01.02 දින සිට බලාත්මක වන පරිදි ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ඒ අනුව අන්තර්ග්‍රහණ ලිපි ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

III. **මෙම විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ 2022.01.02 දින දක්වා සේවා කාලය**

(අ) 2020.07.01 දින සිට ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පලකර ඇති 2022.01.02 දිනට සේවයේ යෙදී සිටින සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් 2022.01.02 දින දක්වා එම නිලධාරීන්ට අදාළ වන පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් අනුව කටයුතු කරනු ලැබේ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk

IV. ගුරු උපදේශක සේවයෙන් 2022.01.02 දිනට පෙර විශ්‍රාම ලබා ඇති ගුරු උපදේශකවරු

(අ) 2022.01.02 දිනට පෙර විශ්‍රාම ලබා ඇති ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරනු ලැබූ නිලධාරීන්ගේ අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය 2020.07.01 ලෙස තවදුරටත් සලකනු ලැබේ.

**V. මෙම චක්‍රලේඛනයේ සඳහන් විධිවිධාන අනුව ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වන දිනය සංශෝධනය කර ගැනීම.**

(අ) 2022.01.02 දිනට සේවයේ යෙදී සිටින ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරනු ලැබූ නිලධාරියෙකුට තම අභිමතය පරිදි තවදුරටත් ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය 2020.07.01 ලෙස සැලකීමට අවස්ථාවක් ලබා දෙනු ලැබේ. එවැනි අවශ්‍යතාවයක් ඇති නිලධාරියකු ඒ සම්බන්ධව වන ඉල්ලීමක් දිවුරුම් ප්‍රකාශයක් ද සමඟ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙම චක්‍රලේඛනය නිකුත් කල දින සිට මාස 03ක් තුල යොමු කිරීමට කටයුතු කළ යුතුය.

03. මෙහි සඳහන් විධිවිධානයන් අනුව ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය පමණක් සංශෝධනය වන අතර මාගේ චක්‍රලේඛ 21/2020 හි සඳහන් අනෙකුත් සියලුම කරුණු නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගනිමින් මා විසින් සිදු කරනු ලැබේ.

05. සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරණ මෙම චක්‍රලේඛයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය චක්‍රලේඛය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය